හෝර්ටන් තැන්නෙන් හෙළි වූ රහස්

# දකුණු ආසියාවේ පැරණිතම ගොවි බිම් මතු වේ

**හෝටන් තැන්න හා ඒ තදාසන්නයේ වසර 20,000 ක පාරිසරික ඉතිහාසය පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ටී.ආර්. ප්‍රේමතිලක මහතා කළ දේශනයක් ඇසුරින් සකස් කරන ලද්දේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන නිලධාරී වාසනා සිරිමල්වත්ත විසිනි.**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ
**ටී. ආර්. ප්‍රේමතිලක** විසිනි

"මෙම දේශනය ඉතාමත් වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන' කෙරෙන්නක්. අප පිළිගන්නා ආකාරයට විසිවෙනි සියවස අග හා දෙවෙනි කාර්තුවේ ලංකාවේ ඉතා විශිෂ්ට යැයි කිවහැකි පර්යේෂණ ව්‍යාපෘති තුනයි සිදුව ඇත්තේ. ඉන් පළමුවැන්න, මානව විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතියක් ද, දෙවැන්න යකඩ තාක්ෂණය පිළිබඳව සිදු කර ඇති පර්යේෂණ හා ප්‍රේමතිලක මහතාගේ මෙම හෝටන් තැන්න සම්බන්ධ පර්යේෂණ මෙහි තෙවැන්නයි. 1950 සිට වසර 2000 තෙක් සිදු කෙරුණු ඉහළම මට්ටමේ වැදගත් පර්යේෂණ ව්‍යාපෘති ලෙසටයි මා මේවා දකින්නේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිරාන් දැරණියගල මෙසේ පැවසුවේ "හෝටන් තැන්න හා ඒ තදාසන්නයේ නව පර්යේෂණ තුළින් හෙළිවන වසර 20,000 ක පාරිසරික ඉතිහාසය" මැයෙන් පසුගියද ජාතික ලේඛනාරක්ෂ දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවති දේශනයේ මුලසුන ගනිමිනුයි. දේශනය පැවැත්වූයේ කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කථිකාචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක මහතායි. සංවිධානය කරන ලද්දේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින්.

'වර්තමානයේ පුරාවිද්‍යාව නොයෙක් නව විෂයයන් ඔස්සේ දියුණු වී තිබෙනවා. ප්‍රේමතිලක මහතා එවැනි නව විෂයක් ඇසුරු කරගෙනයි මේ පර්යේෂණ සිදුකර



**ප්‍රේමතිලක මහතා
තම සොයාගැනීම විස්තර කරමින්**

තිබෙන්නේ තරුණ පුරාවිද්‍යාඥයින් විසිනුයි මෙවැනි නව මංපෙත් සොයා යාම ඉතාම වැදගත්. එසේ වුවත් ලංකාවේ ඉතිහාසය සොයා බලන්නට කියා නිකරුණේ මහ පොළව හාරා දැමීම නම් සුදුසු නෑ. එවිට අනාගතය වෙනුවෙන් කිසිවක් ඉතිරි වන්නේ නෑ. ඒ අතින් ප්‍රේමතිලක මහතා කටයුතු කර ඇත්තේ නියම පුරාවිද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුවයි."

තම අතීතය පිළිබඳව නව කරුණු අනාවරණය කර ගැනීම පිණිස ලොවේ විද්‍යාඥයෝ විවිධාකාරයෙන් උත්සහ කරති. එසේ ශ්‍රී ලංකාවේ ඈත අතීතය පිළිබඳව දැනගැනීම පිණිස කළ පර්යේෂණයන් ලෙස හෝටන් තැන්න හා ඒ තදාසන්නයේ කළ මෙම පර්යේෂණ දැක්විය හැකිය.

ලෝකයේ පැවති අවසාන අයිස් යුගයේ එනම් ප්ලයිස්ටොසීන යුගයේ දී ලංකාවේ පැවති පාරිසරික තත්ත්වයන් පිළිබඳව මෙහිදී ප්‍රධාන වශයෙන් ම අවධානයට යොමු කරන ලදී. කාලය අනුව සලකන විට මේ අධ්‍යාපනය සඳහා වසර 25,000 හා වසර 20,000 තෙක් ඉතිහාසය පිළිබඳව අවධානය යොමු කර ඇත.

මෙසේ සාමාන්‍යයෙන් අප දන්නා වසර 2500 ක ඉතිහාසයෙන් බොහෝ ඈතට විහිද යන ලංකාවේ පාරිසරික ඉතිහාසයත්, මිනිසාත් පරිසරයත් අතර පැවති අන්තර් ක්‍රියාන් අධ්‍යයනය කිරීම යුගයේ දැඩි අවශ්‍යතාවක් ලෙස සැලකිය හැකියි. අතීතය තුළ අපගේ වටාපිටාව පැවතියේ කෙසේ ද? යන්න දැනගැනීමට අනාගතය උදෙසා බෙහෙවින් වැදගත් වේ. මනු පරපුර උදෙසා තම අතීතය නියමාකාරයෙන් පැහැදිලි කිරීම මෙන් ම ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා මෙවැනි පර්යේෂණ තුළින් නිහඬ සේවයක් ද කළ හැකි වේ. එපමණක් ද නොව අතීතයේ එක්තරා කාල පරිච්ඡේදයක පැවති පාරිසරික තත්ත්වයන් පිළිබඳව පොදු සම්මුතියකට එළඹීමට ද ලෝකයේ විවිධ ප්‍රදේශ, විවිධ රටවල සිදුකරන මෙවැනි නව පාරිසරික විග්‍රහයන් බෙහෙවින් වැදගත් වේ.

හෝටන් තැන්න හා ඒ තදාසන්න ප්‍රදේශය ආශ්‍රිතව සිදු කරන ලද මෙම පර්යේෂණ වසර නවයක



**හෝර්ටන් තැන්නේ පර්යේෂණ සිදුවෙද්දී....**

පමණ සිට සිදුකෙරෙමින් පවතී. මෙය කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයත්, ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්ව විද්‍යාලයේ චාතුර්තක භූ ගර්භ විද්‍යා ආයතනය හා උත්සලා විශ්වවිද්‍යාලයේ විද්වතුන් සමග කරන ලද සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතියකි.

මෙම පර්යේෂණවලදී හෝටන් තැන්නේ අතීත පාරිසරික තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කරන ලද්දේ විශේෂයෙන් ම දේශගුණික වෙනස්වීම් (CLIMATE CHANGE) පදනම් කර ගෙන ය. ඒ සමගම පැලෑටිවල ඉතිහාසය හා වනාන්තරවල ඉතිහාසය පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

පුරාණ පරිසරය හා එහි විපර්යාසයන් විග්‍රහ කිරීමේදී පැලෑටි ඉතා හොඳ නිර්නායකයක් ලෙස සලකනු ලැබේ.

එසේ සමහර පැලෑටි මිනිසා සමග ඉතා සමීප සබඳතාවක් පවත්වා ඇත. එවැනි සමහර පැලෑටි වර්තමානයේ දක්නට නොමැත. ඒවා වඳවී ගොස් ය.

එසේ වුවද එම පැලෑටිවල සමහර කොටස්වලට වසර ලක්ෂ ගණනක් විනාශ නොවී පැවතීමේ හැකියාව ඇත.

මෙවැනි පරිසරයේ අදත් සොයා ගත හැකි පරිදි ශේෂ වී ඇති මෙවැනි කොටස් ඇසුරෙන් මෙම පර්යේෂණ සිදු කෙරිණි.

හෝටන්තැන්නේ සිදුකරන ලද, මෙම පර්යේෂණ මාලාවේ තවත් අරමුණක් ලෙස දැක්විය හැක්කේ අතීත මිනිසා භූමිය භාවිතා කළේ කෙසේ ද? (LAND USE HISTORY) යන්නත් සොයා බැලීමයි.

කථිකාචාර්ය ප්‍රේමතිලක මහතා දැක්වූ ආකාරයට මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ඔහු ඇතුළු කණ්ඩායම ප්‍රධාන වශයෙන් ක්‍රමවේදයන් කිහිපයක් (7,8 ක් පමණ) පදනම් කරගෙන තිබේ. මේවා නූතනයේ වෙනත් රටවල් භාවිත කරන නවීනතම විද්‍යාත්මක ක්‍රම මත පදනම් වූ ඒවා ය.

**ක්‍රමවේදයන්**

1. ශ්‍රී ලංකාවට ප්‍රථම වතාවට හඳුන්වා ලෙස ලද ක්‍රමයක් ලෙස



**දහස් වරක් විශාල කළ බාර්ලි පරාග පොසිලයක්**





**දහස් වරක් විශාල කළ පොසිල**

පොසිල පරාග විශ්ලේෂණ ක්‍රමය (POLLEN ANALYSIS)සඳහන් කළ හැකි ය. මෙය මෙහිදී යොදගන්නා ලද ප්‍රධාන ශිල්පීය ක්‍රමයකි.

පරාග ලෙස හඳුන්වන්නේ මල් හටගන්නා ශාකවල මලක අග්ගිස්සේ ඇති රේණුවල ඇති කුඩා පුරුෂ ලිංගික කොටසයි. මෙය ඉතාම ප්‍රතිරෝධී රසායනික ද්‍රව්‍යයකින් ආවරණය වී ඇත. මෙම පරාගවලට පොළවට වැටුණු විට වසර ලක්ෂ ගණනක් විනාශ නොවී පැවතීමේ හැකියාවක් ඇත. මේවා පියවි ඇසට නොපෙනෙන අතර දහස් ගුණයක් විශාල කිරීමෙන් දැකගත හැකි ය.

2. සිලිකාමය ක්ෂුද්‍ර පොසිල පරීක්ෂණය (SILLICIOAS MICRO FOSSIL) මේවා නිර්මාණය වන්නේ පැලෑටි හෝ ගස් තුළ ය. මේවා ද පියවි ඇසට නොපෙනේ. ශාකය විනාශයට පත්වුවද මෙම සිලිකාමය ක්ෂුද්‍ර පොසිල වසර දහස් ගණනක් විනාශ නොවී පවතී.

3. පාරිසරික භූ චුම්භකත්වය වෙනස්වීම මෙය ඉතාම නව තාක්ෂණික ක්‍රමයක් වන අතර මෙමගින් පොළව අභ්‍යන්තරයේ ඇති අවසාදිතවල ඇති චුම්භක ගතිගුණවල වෙනස්වීම් අධ්‍යයනය කෙරේ.

4. කාබන් පරමාණු විග්‍රහ කිරීමේ තාක්ෂණය ද මෙහිදී යොදා ගන්නා ලද වැදගත් ශිල්පීය ක්‍රමයකි (කාබන් 13)

5. නයිට්‍රජන් පරමාණුවල සමස්ථානිත විග්‍රහය

6. විකිරණශීලී කාබන් සමස්ථානික විග්‍රහය

7. පොළව තුළ පස් තට්ටු සකස් වීම හා ඒවායේ ස්වභාවය පිළිබඳව සොයා බැලීම යනාදී ක්‍රමවේදයන් සඳහන් කළ හැක.

මෙම පර්යේෂණ සිදු කළ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ පිහිටි හෝටන්තැන්න අක්කර 7000 ක පමණ භූමි ප්‍රදේශයක් ඇති පුළුල් ස්ථානයකි. මෙවැනි පැතිරුණු භූමියකින් මෙම පර්යේෂණ සඳහා තියැදි ලබා ගත්තේ කුමන ආකාරයට ද? යන ගැටළුව කා තුළත් මතු විය හැකි ය.

එය මැනවින් විග්‍රහ කළ ටී.ආර්. ප්‍රේමතිලක මහතා ප්‍රකාශ කළේ ඔවුන් වසර දෙකක් පුරා පර්යේෂණයට වඩාත් සුදුසු ස්ථාන පිළිබඳව සොයා බැලූ බවයි.

මෙසේ පොළව අභ්‍යන්තරය පරීක්ෂා කිරීම සඳහා ඔවුන් කැණීම් සිදුනොකර ඒ සඳහා අඟලක පමණ විෂ්කම්භයෙන් යුත් කුඩා මෙන්ම සියුම් විදුම් උපකරණයක් (සිලින්ඩරයක්)) භාවිතා කර ඇත. මෙය පොළව තුළට යවා එමගින් ගන්නා පස් සාම්පල (තියැදි) පරීක්ෂා කොට වැඩිදුර පර්යේෂණ සඳහා සුදුසු ස්ථාන පිළිබඳව නිගමනය කර ඇත. මේ සඳහා පස් තියැදි 4000 ක් පමණ යොදා ගෙන ඇත.

මෙම පාරිසරික පර්යේෂණ සඳහා හෝටන් තැන්න පමණක් යොදා ගත්තේ මන්ද යන්න

**හෝටන් තැන්නේ මෙසේ සිදු කළ පර්යේෂණවලදී වැඩි වශයෙන් අවධානය යොමුකරන ලද්දේ වගුරු බිම් කෙරෙහි ය. විදුම් සිලින්ඩරය භාවිතා කර ඉතා හොඳින් පස් සකස් වී ඇති එවැනි ස්ථානයකින් මීටර් 6 ක් පමණ ගැඹුරින් පස් නියැදි ලබා ගන්නා ලදී. එම ස්ථානය මගිනුයි පසුගිය වසර 20,000 ක ඉතිහාසයේ වැදගත් තොරතුරු අනාවරණය වී ඇත්තේ.**



**පර්යේෂණ අවස්ථා කීපයක්**

කෙනෙකු තුළ මතුවිය හැකි සාධාරණ ගැටළුවකි.

කථිකාචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක මහතා දක්වන ආකාරයට මෙම පර්යේෂණවලදී හෝටන්තැන්න පමණක් නොව ශ්‍රී ලංකාවේ සීගිරිය හා ඒ තදාසන්නය, පුත්තලම, මුන්දලම ආදී ස්ථාන ද පරීක්ෂා කරන ලදී. එසේ වුවත් වඩාත්ම සුදුසු ස්ථානය බවට තීරණය කළ හැකිවූයේ හෝටන් තැන්නයි. එක් වචනයකින් හැඳින්වුවහොත් මෙය ලේඛනාගාරයකි. (PHYSICAL ARCHIVES) මෙහි ලේඛන තොරතුරු අපට පියවි ඇසට දකින්නට නොහැකි වුවත් ඒවා අපේ ඈත අතීතය හෙළිදරව් කරන්නාවූ අගනා තොරතුරු සමුදායකි.

හෝටන් තැන්නේ මෙසේ සිදු කළ පර්යේෂණවලදී වැඩි වශයෙන් අවධානය යොමුකරන ලද්දේ වගුරු බිම් කෙරෙහි ය. විදුම් සිලින්ඩරය භාවිතා කර (DRILLING TECHNIQUE) ඉතා හොඳින් පස් සකස් වී ඇති එවැනි ස්ථානයකින් මීටර් 6 ක් පමණ ගැඹුරින් පස් නියැදි ලබා ගන්නා ලදී. එම ස්ථානය මගිනුයි පසුගිය වසර 20,000 ක ඉතිහාසයේ වැදගත් තොරතුරු අනාවරණය වී ඇත්තේ. මෙහි තිබී ඇත්තේ පීට් සහ වැලි තැන්පතු ය. ක්‍රමානුකූලව ස්ථර තැන්පත් වීමක් මෙහි හොඳින් නිරූපණය විය. මෙහි මුලින්ම පැවතියේ

1. පීට් තට්ටුවකි - එහි කොළ රොඩු දිරාගිය කොටස් අඩංගු විය.
2. වැලි මිශ්‍ර පීට් තට්ටුව
3. පීට් තට්ටුව ආදී වශයෙන්

මීටර් 6 ක් පමණ පොළව අභ්‍යන්තරයට විහිදෙන අතර අවසානයේ මව් පාෂාණය (BED ROCK) විය. මෙය ද අභ්‍යන්තරයට මීටර් 6 ක් පමණ දිරා ගොස් තිබිණ. මෙම පරීක්ෂණ ස්ථානයේ විකිරණශීලී කාබන් දින නිර්ණ ක්‍රමයට අනුව කාලනිර්ණ 20 ක් සොයා ගෙන ඇත.

මෙවැනි ස්ථානවලින් ලැබුණු නියැදිවල අඩංගු පොසිල පරාග හා අනෙකුත් සාධක අධ්‍යයනයෙන් තොරතුරු රසක් අනාවරණය කරගෙන ඇත.

මෙම පොසිල පරාග මගින් ඉහළ කඳුකර වැසි වනාන්තරවල පෙර ස්වරූපය, ජලජ පැළෑටිවල තත්ත්වය, ඒවා අඩුවැඩි වීම, මීවන ශාකවල තත්ත්වය ආදී අදින් වසර 20,000 ක පාරිසරික තොරතුරු ලැබී ඇත.



**විශාලනය කළ පරාග**

එක් එක් ශාකයට අයත් පරාගවල සැකැස්ම ශාකයෙන් ශාකයට වෙනස් වේ. මෙවැනි විවිධ ශාකවල පරාග රැසක් ද ලැබී ඇත. එමගින් ඈත අතීතයේ ලංකාවේ පැවති ශාක පිළිබඳව පැහැදිලි අවබෝධයක් දැනුවත් බවක් ඇතිකර ගත හැකි ය. මේ අතර මිනිසා ඇසුරේ වැඩුණු මිනිසා විසින් භාවිතා කළ ශාකවලට අයත් පරාග ද ලැබේ. මෙමගින් ලංකාවේ වගාකිරීම සම්බන්ධ ස්ථිර සාක්ෂි ලැබී ඇත. ඒ ක්‍රිස්තු පූර්ව 8000 තරම් ඈත අතීතයේ දී , ය. විශේෂයෙන්ම යව හා බාර්ලි යන ධාන්‍ය වගාව පිළිබඳව සාක්ෂි ලැබේ. වෙනත් ධාන්‍ය පිළිබඳව ද යම් යම් සාධක ලැබුනද ඒවා ස්ථිරව නිශ්චය කොට නොමැත. අපගේ වෘක්ෂලතාදිය C-3 සහ C4 වර්ගයේ ශාක නමින් කොටස් දෙකකට බෙදා දැක් වේ.C-3යනු වනාන්තර වලට අයත් විශාල ශාක ය.C-4යනු තිරිඟු, ඉරිඟු, රයි, බාර්ලි ආදී ධාන්‍ය වර්ගය (CEREAL PLANTS) මෙම වර්ගයේ ශාකවල විශාල වැඩිවීමක් දක්නට ලැබේ.

මහරත්මල් හා යෝධ මීවන වර්ග බොහෝ කාලයක් පුරා මෙම ප්‍රදේශයේ තිබී ඇති බවටද මෙමගින් තොරතුරු ලැබේ.

වර්තමානයේ හෝටන් තැන්න හා ඒ තදසන්නයේ දක්නට නොමැති වැක්සොයිඩේ කුලයට අයත් කතිංහැමියා ශාක පටන්ම ජුනිෆොරස්ට් නම් ශාකය සම්බන්ධ පොසිල පරාග ලැබී ඇත.

එපමණක් නොව හෝටන් තැන්නේ පරිසරය අද පවතින තත්ත්වයට බෙහෙවින් වෙනස් තත්ත්වයක පැවතුණු බවට තවත් විවිධ සාධක ද අනාවරණය වී ඇත.

ජලාශ්‍රිත ස්ථානවල ඇති ඒක ශෛලික කුඩා පැළැටි වර්ගයක් වන ඩයටම (මෙය දිය සෙවෙල වර්ගයකි) පිළිබඳ පොසිල මගින් හමු වී ඇත. මේවා සිලිකාමය ක්ෂුද්‍ර පොසිල පර්යේෂණවලට ලක්කර ඇත. මෙම ශාකද මගින් පැහැදිලි කර ගත හැකි වූයේ ලෝක මට්ටමින් අදින් වසර 9000 කට පෙර සිදුවූ පරිසයේ උෂ්ණත්වය ඉහළයාම නිසා වර්ෂාපතනය වැඩි වී පරිසයේ විවිධ ස්ථානවල ඇති වූ ජලාශ මෙහිදී ද පැවතුණු බවයි. කෙසේ වුවත් හෝටන් තැන්නේ පැවති පාරිසරික තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරන විට

1. උණුසුම් වනාන්තර
. ශුෂ්කරූපී වන ලැහැබ්
3. කඳුකර වැසි වනාන්තර
4. සම ශීත උෂ්ණ වර්ගයේ වැසි වනාන්තර හා පසුව අද පවතින කඳුකර වැසි වනාන්තර බවට එහි පරිසරය පරිවර්තනය වී ඇත. මෙම විපර්යාසය අධ්‍යයනය කිරීම පුරාතන පරිසරය ගැන පමණක් නොව පුරාතන මානව ක්‍රියාදාමයන් පිළිබඳව කෙරෙන විග්‍රහයන්වලදී ද බෙහෙවින් වැදගත් වේ. මන්ද පරිසරයේ විවිධ ත්තත්වයන් මානව ක්‍රියාකාරකම්, හැසිරීම් තීරණය කිරීමෙහිලා ප්‍රබල සාධකයක් වන බැවිනි.

හෝටන් තැන්නේ සිදුකරන ලද මෑත පර්යේෂණවලට පෙර පුරාවිද්‍යාඥයින් විසින් එහි ශිලා මෙවලම් ආදිය පිළිදව සාධක සොයාගෙන ඇත.

81 වැනි පිටුවට



**විදුම් උපකරණයෙන් පොළොව විනිවිදිමින්**

ඡායාරූප : කැලණිය විශ්ව විද්‍යාලයේ
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඡායාරූප ශිල්පී
**අයි.එස්. මදනායක**

# ලෝකයේ පැරණි කෘෂි කර්මාන්ත පිළිබඳ පුරාවිද්‍යාත්මක සාක්ෂි

**බටහිර ආසියාව, සිරියාව, ඉරාක, ඉරාන, තුර්කිය ආදී රටවල් රැසක ප්‍රථම වරට කෘෂිකාර්මික කටයුතුවල යෙදුණු (ක්‍රිස්තු පූර්ව 9500-7500 අතර) ප්‍රදේශ ගණනාවක්ම යුනෙස්කෝව මගින් ලෝක උරුමය වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.**

**මේ ප්‍රදේශ ගණනාව සඳහාම යොද ඇති නාමය ලෙවන්ට් (LEVANT) වශයෙන් හැඳින් වේ. මේ ප්‍රදේශවල ක්‍රි. පූ. 9500-7500 අතර කාලයේ දී තිරිඟු හා බාර්ලි වගා කිරීම සිදු කර ඇත.**

**දකුණු ආසියාව (ක්‍රිස්තු පූර්ව 7000 පමණ)**

ක්‍රිස්තු පූර්ව 7000 පමණ කාලයේ දී ඉන්දියානු උප මහාද්වීපය ඇතුළු ඉන්දියාව, බලූකිස්ථානය, පාකිස්ථානය, ඉන්දු නිම්නය, පකිස්ථානයේ කචි නිම්නය (KACHI)යන ප්‍රදේශවල ද තිරිඟු හා බාර්ලි වගාව තිබුණු බවට සාක්ෂි ලැබී ඇත.

වී වගාව (ක්‍රි. පූ. 6375-5010)

ඉන්දියාවේ උත්තර ප්‍රදේශවල පිහිටි කොල්ඩිවා(KOOLDIHWA)ක්‍රිස්තු පූර්ව 6375-5010 අතර කාලයේ දී වී වගාව තිබුණු බවට සාක්ෂි ලැබී ඇත.

වී වගාව (ක්‍රි.පූ.2500-1115)

ඉන්දියාවේ පැරණි ශිෂ්ටාචාරයට අයත් දැන් පාකිස්ථානයේ පිහිටි හරප්පා හි ද ඉන්දියාවේ උත්තර ප්‍රදේශ්, රාජස්ථාන්, මහාරාෂ්ට්‍ර, බිහාර්, ප්‍රාන්තවල ද කාෂ්මීර් හි ද වී වගාව ඉහත සඳහන් කාලයේත් ආරම්භ වී ඇත.

**නැගෙනහිර ආසියාව - චීනය**

ක්‍රිස්තු පූර්ව 9000 දී පමණ චීනයේ Yuchayan නමැති ස්ථානයේ වී වගාව පැවතුණු බවට සාක්ෂි ලැබී ඇත.

එහෙත් මේ කාලවකවානුව තවත් ඈතට විහිදී යා හැකි ය.

ක්‍රි.පූ. 7000-5000

චීනයේ Pengtoushan, Yengzi, Valley, කහ ගඟ ආශ්‍රිත නිම්නයේ ද ක්‍රි.පූ.7000-5000 අතර වී වගාව ආරම්භ වී ඇත.

**තායිලන්තය**

තායිලන්තයේ වී වගාව ආරම්භ වී ඇත්තේ ක්‍රිස්තු පූර්ව 6000 දී පමණ ය.

**දකුණු කොරියාව**

ක්‍රිස්තු පූර්ව 4400-3000 අතර කාලයේදී වී වගාව ආරම්භ වී ඇත.

ජපානය

ක්‍රිස්තු පූර්ව 800-300 අතර කාලයේදී වී වගාව ආරම්භ වී ඇත.

චීනය

චීනයේ මීට වසර 11500 ඉහත කාලයේදී XIANREDON, DIATONGHUAN, YENGTZEයන ස්ථානවල වී වගාව පැවති බවට සාක්ෂි ලැබී ඇත.

ඇමරිකාව

ඇමරිකාවේ ඉරිඟු වගාව ක්‍රි. පූ. 5000 දී ඇරඹී ඇත.

අප්‍රිකාව

වී වගාව ක්‍රිස්තු පූර්ව 4100 දී ආරම්භ වී ඇත. මිලට්, බාර්ලි හා තිරිඟු වගාව ක්‍රි. පූ. 6000 දී පමණ අප්‍රිකාවේ ඇරඹී ඇත.

යුරෝපය

ක්‍රිස්තු පූර්ව 6500 දී පමණ බෝල්කන් සහ ග්‍රීසිය යන ප්‍රදේශවල ධාන්‍ය වගාව ආරම්භ වී ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ

**Chen Shen and G.W.Crawfors : 1988, The Origin of Agriculture: recent progress in East Asia antiquily (72)**

## දකුණු ආසියාවේ...

11 වැනි පිටුවෙන්

මෙතෙක් මේ සම්බන්ධයෙන් පැවති අදහස වූයේ මධ්‍ය ශිලා යුගයේ මානවයින් මෙහි වාසය කළ බවයි. එසේ වුවත් මෙම නව පාරිසරික පර්යේෂණ හා එමගින් කළ සොයා ගැනීම් අනුව මෙම මධ්‍ය ශිලා යුගයේ මිනිසා (MESOLITHIC MAN) කෘෂිකාර්මික යුගයකට පරිවර්තනය වීම පැහැදිලිව දක්නට ලැබේ.

මෙතෙක් කළ පර්යේෂණ අනුව ලංකාවේ වෙනත් ප්‍රදේශවලින් සොයා ගැනීමට නොහැකි වූ ලංකාවේ නව ශිලා යුගයේ සාධක හෝටන් තැන්නේ පර්යේෂණ මගින් අනාවරණය වීම වැදගත් ය. එසේ වුවත් තවදුරටත් පුළුල් පර්යේෂණ සිදුකිරීම වැදගත් වේ.

නියම කෘෂිකර්මය ආරම්භ කිරීමට පෙර එයට අවශ්‍ය මූලික ක්‍රියාදමයත් සිදුවී ඇති බව කීකිරිඳිය මෙන් ම කරඳමුංගු හා සම්බන්ධ පැළෑටි ආදී, විශේෂයෙන් මිනිසුන් ඇසුරේ වැඩෙන පැළෑටිවර්ගවල පොසිල පරාග ලැබීමෙන් පැහැදිලි වේ.

මේවා මෙන් ම මිනිසාගේ වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳව ඉඟි සපයන සාධකයක් ද ලැබී ඇත. මෑතක කරන ලද ගවේෂණයකට අනුව හෝටන් තැන්න ප්‍රදේශයෙන් මැටි මෙවලම් කැබලි කිහිපයක් ලැබුණි. ඒවා කාල රක්ත වර්ණ මැටි මෙවලම් වර්ගයට (BLACK AND RED WARE) අයත් වේ යැයි සැලකේ. නමුත් මෙම මෙවලම් කැබලි තවමත් වැඩිදුර පර්යේෂණවලට ලක් කර නොමැත.

හෝටන් තැන්නේ වසර නවයක් පුරා දියුණු විද්‍යාත්මක ක්‍රම ඇසුරින් සිදු කරන ලද පර්යේෂණ ලංකාවේ ඉතිහාසයෙන් ඈතට විහිදී යන ප්‍රාග් ඉතිහාසය සම්බන්ධ ඉතාමත් වැදගත් සොයා ගැනීම් වේ. මෙම කෘෂිකර්මය සම්බන්ධ සාධක ලංකාවේ පමණක් නොව දකුණු ආසියාවේම පැරණිතම සාධක වන්නේ ය. ❑

